# ඇයි නායකයින්ට කැපකිරීම් පෙන්වන්න බැරි?

මන් කිරිබත්කුඹුර හන්දියේ රස්තියාදු වුණා වාහනය කැඩිල හදාගන්න. ඒ හරියේ හැමෝම මාව හොඳට අඳුනනවා ඡන්ද ගණනවාකට ඉදිරිපත් වුණ නිසා.

පළමුවෙන් 1989 මහ ඡන්දයට මන් එක්සත් සමාජවාදී පෙරමුණේ නායකයා හැටියට මැතිවරණයට ඉදිරිපත් වුණා.

ඒ දවස්වල ලොකු සිවිල් යුද්ධයක් වගේ තමයි ඡන්දය තිබුණේ. ඒ වුණත් සැහෙන පිරිසක් අපට එකතු වෙලා සහයෝගය දුන්නා. ළඟදී මිය ගිය සංවර්ධන පෙරමුණේ නියමුවා අසෝක සුරවීරත් මගෙ එක්කලා ඡන්දයට ඉදිරිපත් වුණා.

ඒ අනුව හන්දියේ උදවිය ඇවිත් මා එක්ක කතාබහ කළා. ඒ හැම කෙනෙක්ම කිව්වේ මේ දන් තියෙන බදු වලින් හා පරිසර නීතිවලින් පොඩි මිනිහට හෙල්ලෙන්න බැරි වෙනව කියල.

කිරිබත්කුඹුර, නුවර පාරේ තිබුණත් තවමත් ගම්බද නගරයක්. එතැන ඉන්න හුඟ දෙනෙක් පාරම්පරික අය, නැත්නම් කවුරු හරි මගින් පන්සල් ඉඩම් බදු අරගත් අය. ලොකු පොහොසත් අය නෙවෙයි.

බැලුවහම මේ අයටත් පරිසරය විනාශ කළා කියල දඩ වැදිල. ආයුධ පාවිච්චි කළා කියල බදු වැටිල. පොඩි ගණන් නෙමේ. දස දහස් ගණන්.

දෙහිගම ගරාජ් එකක අබේයි, එයාගේ මල්ලීයි ඔක්කොම මන් අඳුරනවා. දෙහිගම ගරාජ් එක පටන් ගත්තේ ඒ ඇත්තන්ගේ අප්පච්චිලාගේ කාලේ. තවමත් ලැබෙන ඉඩ අනුව වැඩ කරන අය.

දන් පාර අද්දර ඉඳන් වාහනයකට තීන්ත ටිකක් ගාන්න තියා හුරන්නත් බැරිලු. කඩා පනින හමුදාවලින් දඩ එල්ල කරන නිසා.

හන්දියේ තියෙන බේකරිය සූරිගොඩ නිළමේ පටන් ගත්තේ. දන් ඒ අයගේ මුණුපුරෝ කරන්නේ. ඒ එක පුතෙක් ජනාධිපතිගේ පුතත් එක්ක රගර් සෙල්ලම් කරපු කෙනෙක්. ඒ හින්දා මහින්දගේ පවුලට හිතවත්.

ඒත් දන් ඒ අයත් කිව්වේ ගහන බදු අනුව බේකරිය වහන්න වෙනව කියල. පරිසර කරුණු උඩ ලොකු දඩයක් එක පාරටම එල්ල කරල. දන් නම් රජයත් එක්ක ඔට්ටු වෙලා ඉන්නේ. අම්බානකට බනිනවා පොඩි මිනිහට කරන කරදරවලට.

මේ විදියට ඒ පුංචි නගරය පුරාම මිනිස්සු මට එක එක කතා කිව්වා. ඒ දවස්වල අපි දිහා ඔරවපු උදවියත් දන් නම් දුවගෙන ඇවිත් කතා කරනවා. පැහැදිලිවම ජන විඥානයේ වෙනසක් සිදු වී ගෙන යනවා.

ඒක කොයි තරම් විපක්ෂ දේශපාලන දිසාවන්ට ගිහිල්ලද කියල මට කියන්න බෑ. ඒත් විරුද්ධත්වය දක්වීමට යූඇන්පී, නැත්නම් ජේවීපි යන දොකොටසටම ගොනු වෙන්න ඉඩ තියෙනවා, වෙන හොඳ විකල්පයක් නැත්නම්.

ආණ්ඩුවේ උදවිය නම් කියන්නේ දන් හැම වෙළෙඳ ව්‍යාපාරයම ඉහළ යනව කියලයි. ඇත්ත නම් සංචාරක ව්‍යාපාරවලට නම් වැඩ වැඩි වෙලා, දන් විවිධ රටවල් වලින් මිනිස්සු ගලාගෙන එනවා මේ අපූරු රට බලන්න.

ඒ වුනත් මුදල් විශාල වශයෙන් වියදම් කරන පොහොසත් සංචාරකයින් එනව කියල කියන්න බෑ. මැච් බලන්න නම් යම් පිරිසක් ඇවිත් බව ඇත්ත. ඒ වුණත් මේ රට තුළ හැම කෙනෙක්ම සංචාරක ව්‍යාපාරයට ගොනු වෙලා රට දියුණු කරන්න බැහැ.

ඇත්තටම ගොවියා, කිරි ගොවියා, ධීවරයා, කුකුළ් ගොවියා සුලු කර්මාන්තකරුවා කියන නිෂ්පාදන ආයතනවලට නැගිටීමක් නැත්නම් ගමට සංවර්ධනය ආවා කියල කියන්න බැහැ. ආණ්ඩුව කියන්නේ ඒ අයට අමාරුකම් තියෙන්නේ වැස්ස වැඩි වුන නිසා කියල.

වැස්සෙන් ගංවතුර ගලල කුඹුරු පාළු වුනා. එළවළු නරක් වුනා. හරක්, එලුවෝ, ආදි සත්තු ගහගෙන ගියා. පොල්ගස් කඩා වැටුනා. මේවා නිසා ඒ කොටස්වල භාණ්ඩ වෙළෙඳපොලට එනව අඩුයි. මේ නිසා තමා මේ භාණ්ඩ ගණන්. මේක තමා ආණ්ඩුවේ උත්තර බැඳිල්ල.

ඒත් ගම් මට්ටමේ නිෂ්පාදකයාට, කර්මාන්තකාරයට මේ රජයෙන් ලැබුන උදව්ව මොකක්ද? මොකුත් නැහැ. ඇත්තටම උදව් වුණේ බහුජාතික සමාගම්වලට මේ රටට ඇතුල් වීමටයි. ඒ නිසා පුංචි මිනිහට ලොකු ඉඩක් ලැබුනේ නැහැ.

උඩුනුවර කිරි නිෂ්පාදක සංගමයේ 600 කට වැඩි පිරිසක් හිටියත් දන් ඉන්නේ 160 ක් විතර කියල මල්ලි කෙනෙක් මට කිව්වා. ඇත්තටම තනි හරකා තියාගෙන හිටපු හුඟ දෙනෙක් උන් විකුණලා දමල. ඒ ලාභයක් හරියට ගන්න බැරි නිසා.

චීනයෙන් බඩු ගෙනත් විකුණන මගේ යාලුවෙක් නම් මට කිව්වේ ඉතාම හොඳ තත්ත්වයක් තියෙනවා කියල. එයාගේ වෙළෙඳාමට විතරක් නෙවෙයි චීන බඩු ගෙන්වන මුළු පිරිසටම ලොකු ඉඩක් ඇති වෙලා කියල.

ඒ උඩ ඔවුන් අතර තිබුන ජාතිබේද කථාබහ අඩු වෙලා. ඔක්කොම එක සහෝදරයෝ වගේ වැඩ කරනව කියලත් කිව්වා. ඒ විදියට බැලුවොත් බඩු ගෙන්වන අයට තත්ත්වය හොඳයි.

චීනෙන් විතරක් නෙවෙයි, වෙන රටවල්වලින් වුණත් බඩු ගෙන්වන අයට දන් තත්ත්වය හොඳයි. ජාති, ආගම්, කුලබේද නොතකා ඒ කොම්පැණිකාරයෝ ඔක්කොම එකතු වෙලා රජයට ලොකු සහයෝගයක් දෙනව ඇති. ඇත්තටම ඉස්සෙල්ලා යූඇන්පි, ජේවීපී කියල හිටපු උදවියත් දන් ජාතික සමගිය වෙනුවෙන් මහින්දට උදව් වෙනව කිව්වත් පුදුමයක් වෙන්න බෑ.

රටම විනාශකාරී ව්‍යාපාරික දේශප්‍රේමය උඩ දුවන බවයි කියන්න වෙන්නේ. ඉස්සර මේ දේශප්‍රේමීන් හිටියේ යූඇන්පීයත් සමඟ. මොකද? ව්‍යාපාරික ප්‍රජාවට ලොකු උදව්පදව් කළේ ඒ ඇත්තො නිසා. දන් ඒ කතාව වෙනස්වෙලා.

ව්‍යාපාරික ප්‍රජාවෙන් සම්ප්‍රදායික අයත් දන් මහින්දට හිතවත් වෙලා. සිංහල ජාතික ව්‍යාපාරය කොහොමටත් හිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බරවයි. ඒ නිසා දන් මේ දොගොල්ලොම එකතු වෙලා මහින්ද වටා රොක් වීම ජනබලයක් නූනත් මුදල් බලයක්.

මේ බලය උඩ තමා දන් මහින්දට කට ඇරලා රටට ආදරය කිරීම ගැන කියන්න වෙලා තියෙන්නේ. රට රිදී බන්දේසියක තියල බහුජාතික සමාගම්වලට පූජා කරන මහින්දටත් මේ විදියට දේශප්‍රේමය ගැන බේගල් ඇද දාන්න පුළුවන් වීමත් ලොකු ප්‍රශ්නයක්.

හැබැයි මේ වෙනකොට ගම් මට්ටමේ ලොකුවට බදාගෙන කෑගහන අය නම් මහින්දට අඩු වෙලා. විශේෂයෙන් මැදපෙරදිග ජනතා අරගල සමඟ ලොකු බියක් ආණ්ඩුවේ ඇත්තන්ට ඇති වෙලා.

විශේෂයෙන් ගඩාපිගේ වැටීම ලොකු ප්‍රශ්නයක්. මොකද? ගඩාපි හිටියේ ලොකු සමාජවාදියෙක් හැටියට පෙන්නමින්. ලිබියානු සමාජවාදී ජනරජය හැටියට නම් කරගෙනයි හිටියේ.

ඒත් ලිබියාවෙන් හොරාගත් සල්ලි බිලියන ගණනක් ඇමරිකාවට අයිති බැංකුවල තැන්පත් කරල තිබුණ බව එළිවෙලා තියෙනවා. ගඩාපි එහෙම නම්, ගඩාපිගේ යාලුවත් ඒ වගේ තමයි කියල ජනතාව හිතනවා. මොකද? පහළ ජනතාවට ලොකු අඩුපාඩු කම් තිබුණත් ඉහළ අයගේ මහුල් කෑම නම් අඩු වෙලා නෑ.

දන් ලොකු හොටල්වල දේශපාලන රැස්වීම් පැවැත්වීමත් එක පුරාජේරුවක් වෙලා. ඉහළින් කවුරුවත් පටි තද කරගත්ත පාටක් පෙන්න නෑ. ඒ අනුව කොහොමද පොඩි අයට රට වෙනුවෙන් කැප වෙන්න කියන්නේ.

මේ විදියට කල්පනා කරන ආණ්ඩුවට ලැදි උදවිය පවා ප්‍රශ්න කරනවා, ඇයි අපේ නායකයින්ට කැපකිරීම් පෙන්වන්න බැරි කියලා. ජනාධිපති නිවාඩුවට ඇමරිකාවේ මල්ලිගේ Farm එකට වෙලා හිටියා. එයා යනකොට නිකම් ගියේ නැනේ. විශාල පිරිසක් එයට වියදම් කරගෙන ගියා.

මේවා දකින කොට ජනතාවට මොකද හිතන්නේ. අමාරුකම්. බඩගින්න ඇති රටක ජනතාවට පටි තද කරගන්න කියල පාලකයා ඇමරිකාවට මහ පිරිසක් සමග ජොලි ගමනක් යනවා නම් ඒ අය කරන ඉල්ලීම්වලට වලංගුකමක් ලැබෙයිද?